M721

# අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ සිසුන් දෙමාපිය භූමිකාවන් ආශ්‍රිතව මුහුණ පාන මානසික ගැටලු පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ

අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කරන

පර්යේෂණ කෘතිය

541142

UCLIB
541142

University of Colombo Library Sri Lanka

2007.02.10
අධ්‍යාපන පීඨය
කොළඹ විශ්ව විද්‍යාලය
කොළඹ 03

එම්.පී.සුමනා
2004 / M.Phil / 24
B.Com. Sp. (University of Colombo)
P.G.D.E., Merit (Open University)
M.E.D. (University of Colombo)

# සංක්ෂිප්තය

පුද්ගල ජීවිත කෙරෙහි දැඩි ලෙස බලපාන සියලුම සමාජ සමූහ වලින් ප්‍රධාන වන්නේ මානව පවුලයි. මානව පවුලේ දරුවන්ගේ සංවර්ධනයට ප්‍රධාන භූමිකාවන් වන්නේ මව සහ පියාය. කාලීන සමාජ ආර්ථික රටාවේ වෙනස්වීම් සමඟ මව සහ පියාගේ කාර්ය භාරයද සංකීර්ණ වීම හේතු කොට ගෙන උසස් පෙළ සිසුන්ගේ මානසික තත්වයන් කෙරෙහිද අහිතකර වූ බලපෑම් හට ගෙන ඇත. මෙම තත්වය තුළින් සිසුන් සැකය, අසහනකාරී බව, සිත් චංචල බව, කුපිතකාරී හැඟීම්, දැඩි පෙළඹවීම්, නොරිස්සුම් ගති, ගැටුම්, හිරිහැර කිරීම්, ආතතිය හා පීඩනය යනාදී විවිධ මානසික ගැටලුවලට මුහුණ දීමට සිදු වීම උසස් පෙළ නව යොවුන් සිසුන්ගේ සංවර්ධන ක්‍රියාවලින්ට ඉමහත් බාධාවක් වේ. එසේම උසස් පෙළ විභාගයේ ඇති අධි තරඟකාරීත්වය හමුවේද සිසුනට මෙම මානසික ගැටලුවලට මුහුණ දීමට සිදුවීම කණගාටුවට කරුණකි. මේ අනුව බලන කල අ.පො.ස.ප. උසස් පෙළ සිසුන් දෙමාපිය භූමිකාවන් ආශ්‍රිතව මුහුණ පාන මානසික ගැටලු පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් ලෙස මෙම පර්යේෂණ කෘතිය ඉදිරිපත් කිරීම කාලෝචිත මෙන්ම වැදගත් වේ.

දොළොස්වන ශ්‍රේණියේ සිසුන්ගේ කායික, මානසික, සමාජයීය, බුද්ධි වර්ධන අවස්ථා සහ ඒ සඳහා දෙමාපිය භූමිකාවන්ගේ ඇති බලපෑම හා දෙමාපියන්ගේ රැකියාව, සමාජ හා ආර්ථික තත්වයන් ඔස්සේ පැන නඟින මානසික ගැටලු විමසා බැලීම, දෙමාපියන් හා සිසුන් අතර අන්තර් සම්බන්ධතා හා දෙමාපිය අපේක්ෂාවන් තුළින් සිසුන් මුහුණ දෙන මානසික ගැටලු විමසා බැලීම, එම මානසික ගැටලු අවම කිරීමට විසඳුම් හා යෝජනා ඉදිරිපත් කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණු වේ. මෙම අධ්‍යයනයට ගාල්ල දිස්ත්‍රික්කයේ අම්බලන්ගොඩ අධ්‍යාපන කලාපයේ 1AB ජාතික පාසල් තුනක්, 1AB ජාතික නොවන පාසල් තුනක් හා 1C පාසල් තුනක් ලෙස පාසල් නවයක් ඇසුරින් අහඹු ක්‍රමයට සිසු සිසුවියන් දෙසිය දහයක් හා ගුරු භවතුන් දහ අටක් තෝරා ගැනිණ. මෙම ගුරු, සිසු නියැදීන් ඇසුරින් සමීක්ෂණයක් පවත්වා අධ්‍යයනයට අදාල දත්ත රැස්කර ගන්නා ලදී. ප්‍රශ්නාවලි ඇසුරින් ලබා ගත් දත්ත ප්‍රතිශත, වගු, ප්‍රස්ථාර හා කයි වර්ග පරීක්ෂණ ක්‍රම මඟින් විශ්ලේෂණය කොට ඇත. උසස් පෙළ සිසුන් අයත් වන නව යොවුන් වියට අදාල සංවර්ධනාත්මක ලක්ෂණ හඳුන්වා දෙමින් දෙමාපිය භූමිකාවන් ආශ්‍රිතව සිසුන් මුහුණ දී ඇති මානසික ගැටලුකාරී තත්වයන් විග්‍රහ කොට දක්වා ඇත.

දෙමාපිය භූමිකාවන් ආශ්‍රිත සමාජ, ආර්ථික, අන්තර් සම්බන්ධතා හා අපේක්ෂාවන් තුළින් සිසුන් විවිධ වූ මානසික ගැටලුවලට මුහුණ දී ඇති බවත්, ගැහැණු සිසුනට හා පිරිමි සිසුනට මෙම මානසික ගැටලු බොහෝ දුරට එක සමාන ලෙස බලපා ඇති බවත් අධ්‍යයනයෙන් හෙළි විය. තවද ගැහැණු සිසුනට, දෙමාපියන් හා සිසුන් අතර අන්තර් සම්බන්ධතා, දෙමාපිය අධි විභාග අපේක්ෂාවන්, දෙමාපියන්ගේ රැකියාව ආශ්‍රිත අඩු ආදායම් තත්වයන් හා ප්‍රේම සබඳතා ද පිරිමි සිසුනට දෙමාපියන්ගේ ආර්ථික දුෂ්කරතා, දෙමාපියන්ගේ රැකියාවන් ආශ්‍රිත අඩු ආදායම් තත්වයන්, දෙමාපියන්ගේ රැකියාවල ස්ථිරබවක් නොමැති වීම හා ප්‍රේම සබඳතාද ප්‍රබල මානසික ගැටලුකාරී තත්වයන් ලෙස අධ්‍යයනයෙන් හඳුනා ගත හැකි විය. අධ්‍යයනයෙන් හඳුනා ගත් සිසු මානසික ගැටලු අවම කොට සමබර සිසු පෞරුෂ සංවර්ධනයක් ගොඩ නංවා ගැනීම සඳහා විධිමත් පාසල් උපදේශන සේවාවක් සෑම පාසලකම ක්‍රියාත්මක කිරීම මුල් කොට ගත් යෝජනා මාලාවක්ද මෙම අධ්‍යයනය මඟින් හඳුන්වා දී ඇත.

# Abstract

Human family is the most influential of all the social groupings. Mother and father play an initiative role to promote the development of the children in the human family with the changes of the social and economical patterns of the society. The resposibilities of mother and father also are subjected to changes and this complex situation in turn has created bad effects in the mind of the teenage students. The results of these conditions have compelled the students to face, the various mental problems such as suspicion, frustration, depression, anger, conflicts, intolerance, oppression and stress which in turn hinder the developmental process of the G.C.E. Advanced Level teenage students. It is a tragical aspect to face these problems in when they are at the werge of the most competetive G.C.E. Advanced Level Examination. It is a timely important act to present this research about an Analysis study of the parental role connected with the mental problems faced by the G.C.E. Advanced Level students.

The objectives of this research are discussing the stages of development of the advanced level grade twelve students, examining the mental problems originated due to parental roles and presenting suggestions to minimize the mental problems. This study is limited to Ambalangoda education zone in Galle district. Among the schools, nine schools have been selected in which G.C.E. Advanced Level classes are available. Three 1AB national schools, three 1AB non national schools and three 1C schools are included in this study. A random sample selected consists of two hundred and ten students and eighteen teachers. Data was collected for this study by conducting a research from the students and teachers samples. The datas collected by questionnairies are analyzed as percentages, tables, diagrams and Chi square. By introducing the developmental process of the teenagers, the mental problems faced by the students with regards to the parental roles are analyzed in this study.

The study reveals that social, economical, interrelationships and expectations with regard to parental roles have influenced the male and female students identically. Interrelationships between parents and students, higher examination expectations, low income conditions of the parental occupations and love affairs contribute to mental problems in female students while parental economic problems, unstable occupations, low income conditions of the parental occupations and love affairs are the causes of mental problems among male students. Solutions and suggestions are also provided to minimize the mental problems faced by the Advanced Level grade twelve students, giving priority to establishing formal councelling service in each school and to equip the students with stable personality.